සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

# 52 - නර්තනය (දේශීය)

## නව නිර්දේශය

Department of Examinations

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2020 (නව නිර්දේශය)

## 52 - නර්තනය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

### I පත්‍රය

කාලය පැය 02 යි.

වරණ 5 න් යුත් බහුවරණ ප්‍රශ්න 25 ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 25 කි.

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 කි. (50 x 02) මුළු ලකුණු 100 කි.

### II පත්‍රය

කාලය පැය 03 යි.

මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.

I කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 02 කි.
1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.

II කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 03 කි.
අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු සැපයිය යුතුය.

III කොටස - ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 03 කි.
අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු සැපයිය යුතුය.

II හා III කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්යය ප්‍රශ්න 02 ද ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06 ක්ද (ii) කොටසට ලකුණු 06 ක්ද (iii) කොටසට ලකුණු 08 ක්ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමිවේ.

| | |
|---|---|
| පළමු පත්‍රය (ප්‍රශ්න 50 x 2) | ලකුණු 100 |
| දෙවන පත්‍රය (ප්‍රශ්න 20 x 5) | ලකුණු 100 |
| I හා II පත්‍ර සඳහා 100 + 100 | ලකුණු $\frac{200}{2}$ |
| අවසාන ලකුණු | ලකුණු 100 |

Department of Examinations

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

උදාහරණ : ප්‍රශ්න අංක 03

(i) ............................................................ √ $\triangle \frac{4}{5}$
............................................................
............................................................

(ii) ............................................................
............................................................ √ $\triangle \frac{3}{5}$
............................................................

(iii) ............................................................
............................................................ √ $\triangle \frac{3}{5}$
............................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

Department of Examinations

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

***

Department of Examinations

අභිමතාර්ථ -

I වන ප්‍රශ්න පත්‍රය

01. දේශීය නර්තන කලාවේ සාම්ප්‍රදායික නර්තන, ගායන, වාදන හා තාල පද්ධතිය පිළිබඳ න්‍යායාත්මක කරුණු අවබෝධයෙන් යුතුව ප්‍රකාශ කරයි.

02. දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු, ශාන්තිකර්මවල අනන්‍යතා ලක්‍ෂණ, ආගමික, සමාජීය හා සංස්කෘතික වටිනාකම අගය කරයි.

03. භාරතීය නර්තනවල සාම්ප්‍රදායික ලක්‍ෂණ, තාල අවබෝධය හා බටහිර බැලේ සම්ප්‍රදායෙහි විශේෂතා පිළිබඳ අවබෝධයෙන් විශ්ලේෂණය කරයි.

04. ජාතික සංස්කෘති උරුමයන් හා පරිසර නිරීක්‍ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් කලාකෘති හා නිර්මාණ නම් කරයි.

05. නව නර්තන නිර්මාණ, කැටයම් කලාව ආනුෂංගික කලා පිළිබඳ වටිනාකම ප්‍රකාශ කරයි.

II වන ප්‍රශ්න පත්‍රය

01. දේශීය නර්තන කලාවේ සම්ප්‍රදායික නර්තන / ගායන, වාදන හා එහි අන්තර්ගත තාල පද්ධතිය වෙන්කොට හඳුනා ගනිමින් තාල ප්‍රස්තාරකරණය භාවිත කර විශ්ලේෂණය කරයි.

02. දේශීය නර්තන කලාවේ යුගාන්තර විකාශනය, ශාන්තිකර්ම තුලනය, ආගමික, සමාජීය හා සංස්කෘතික වටිනාකම අගය කරයි.

03. භාරතීය නර්තන සම්ප්‍රදා, බටහිර බැලේ රංගකලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු, වෙනස්කම් පිළිබඳ දැනුම, අවබෝධය හා භාවිතයෙන් විශ්ලේෂණ හැකියාව ප්‍රදර්ශනය කරයි.

04. පර්යේෂණ කෘති පරිශීලනයෙහි වටිනාකම හා නිර්මාණාත්මක නර්තන, අද්‍යතන ප්‍රාසංගික වේදිකාව හා ආනුෂංගික කලාවන් අගය කරයි.

05. ජාතික උරුම, සමාජීය පසුබිම මනා චින්තනයෙන් හා උසස් රසඥතාවයෙන් යුතුව අධ්‍යයනය කරමින් බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම විචාරාත්මකව විග්‍රහ කරයි.

Department of Examinations

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නර්තනය - (දේශීය) I
நடனம் - (தேசிய) I
Dancing - (Indigenous) I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ........................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 03 | |
| 02 | 04 - 13 | |
| 03 | 14 - 21 | |
| 04 | 22 - 35 | |
| 05 | 36 - 43 | |
| 06 | 44 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අධි/ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**

* ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **02** බැගින් මුළු ලකුණු **100** කි.

Department of Examinations

● අංක **01** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ ලියන්න.**

**1.** පා සරඹ සහ මණ්ඩි පදවල මූලධර්ම හඳුනාගෙන නර්තනය පුහුණු කිරීමෙන්, නිවැරදි
(1) හස්ත චලන ඉදිරිපත් කිරීමේ හැකියාව ලබාගනී.
(2) මූලික අංගහාර සකස් කර ගැනීමේ හැකියාව ලබා ගනී.
(3) ශාස්ත්‍රීය පද නර්තනය කිරීමට හැකියාව ලබාගනී.
(4) තාල තැබීමේ හැකියාව වර්ධනය කර ගනී.
(5) ශරීර නම්‍යතා හැකියාව ලබාගනී. (.........)

**2.** පිළිවෙළින් උඩරට, පහතරට සහ සබරගමු වන්නම් වන්නේ,
(1) මුසලඩි, එක්තාලය සහ නාග ගජගා වේ.
(2) සැවුලා, දෙතාලය සහ කදම්භ පක්ෂී වේ.
(3) ගජගා, නළුගීතිකා තාලය සහ තිසරා වේ.
(4) මයුරා, ලලිතරාග තාලය සහ හනුමා වේ.
(5) කොවුලා, ග්‍රහදණ්ඩ තාලය සහ කිරළා වේ. (.........)

**3.** මංගලම් නර්තනය ඉදිරිපත් කරනු ලබන තිත් රූපය දැක්වෙන වරණය තෝරන්න.
(1) 12 / 12 / 12 / 123 / 1234
(2) 12 / 12 / 123 / 123 / 1234
(3) 12 / 12 / 123 / 1234 / 1234
(4) 12 / 12 / 12 / 123 / 123
(5) 12 / 12 / 12 / 1234 / 1234 (.........)

4. "වලියක් මංගල්‍ය විමසුම" සහ "සබරගමු නර්තන කලාව" යන කෘති රචනා කරන ලද්දේ පිළිවෙළින්,
(1) මුදියන්සේ දිසානායක සහ ජයසේන කෝට්ටගොඩ ය.
(2) මුදියන්සේ දිසානායක සහ තිස්ස කාරියවසම් ය.
(3) මුදියන්සේ දිසානායක සහ ශ්‍රියානි රාජපක්ෂ ය.
(4) ජේ.ඊ. සේදරමන් සහ ශ්‍රියානි රාජපක්ෂ ය.
(5) ශ්‍රියානි රාජපක්ෂ සහ ලයනල් බෙන්තරගේ ය. (.........)

5. "තහලම් කළබෙර තම්මැට පට තත්තිරි ඩමරු..." යන කවිය සඳහන් වන්නේ, ගම්පොළ යුගයේ රචිත
(1) මයුර සංදේශයේ ය.
(2) තිසර සංදේශයේ ය.
(3) පරවි සංදේශයේ ය.
(4) සැළලිහිණි සංදේශයේ ය.
(5) ගුත්තිල කාව්‍යයේ ය. (.........)

6. "ගුම් දැහිං ගුඳ ගුඳ දැහිං - රිංගත ගදිගත ගුදිතක දිකුදකු දොම්" යන පදයෙන් සභාවට පිවිසෙන චරිතය වන්නේ,
(1) ජසයා ය.
(2) නොන්චි ය.
(3) ලෙන්චිනා ය.
(4) අණබෙරකරු ය.
(5) මුදලි ය. (.........)

7. කළුකුමාර බලිය සහ කපුයන්ත්‍රය යන සැරසිලි අන්තර්ගත ශාන්තිකර්මය කුමක් ද?
(1) දෙවොල්මඩුව
(2) පහන්මඩුව
(3) සූනියම
(4) රටයකුම
(5) වලියකුම (.........)

8. මුල්මාත්‍රයට අදාළ මූලික බෙරපදය අයත් වරණය තෝරන්න.
(1) කුං දිත් තත් රෙගත ගදිත ගත.
(2) ගත් දිත් තත් දොම්ත ගදිත ගත.
(3) දොං තකු දොං ජිංතක තරිකිට.
(4) කුං දිත් තත් දොං තක තරිකිට.
(5) ජිංත ජිමිත්තක් තක්කිට තරිකිට. (.........)

9. බලි ඇදුරාගේ රංග වස්ත්‍රාභරණවලට අයත් කොටස් වන්නේ,
(1) ජටාව, අවුල්හැරය සහ බන්දි වළලු ය.
(2) ජටාව, උරබාහු සහ අවුල්හැරය ය.
(3) සේලය, ජටාව සහ අවුල්හැරය ය.
(4) උරමාලය, නවගුණවැල සහ ඉනහැඩය ය.
(5) උරමාලය, නවගුණවැල සහ පච්චවඩම ය. (.........)

10. "ඉනේ හවඩි රන් කෙඳිවන් පයේ ගිගිරි වළලු ලවන්" යන කවිය අයත් වන්නේ,
(1) මඩුපුරයට ය.
(2) නානුමුරයට ය.
(3) කොහොඹාහැල්ලට ය.
(4) ග්‍රහපන්තිවලට ය.
(5) සිරසපාදවලට ය. (.........)

11. මාත්‍රා 2 + 3 තාලරූපයට සමාන කර්ණාටක තාලය වන්නේ,
(1) ඛණ්ඩ චාපු තාලය යි.
(2) තිශ්‍ර චාපු තාලය යි.
(3) මිශ්‍ර චාපු තාලය යි.
(4) රූපක තාලය යි.
(5) ආදි තාලය යි. (.........)

12. වෙනිවර, ගැටිය හා සවරම යොදාගනු ලබන්නේ පිළිවෙළින්,
(1) ගැටබෙරය, පහතරට බෙරය හා උඩැක්කියට ය.
(2) ගැටබෙරය, දවුල හා උඩැක්කියට ය.
(3) පහතරට බෙරය, උඩැක්කිය හා දවුලට ය.
(4) පහතරට බෙරය, තම්මැට්ටම හා දවුලට ය.
(5) තම්මැට්ටම, ගැටබෙරය හා උඩැක්කියට ය. (.........)

13. අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ සාධක දැක්වෙන මූලාශ්‍රය ලෙස සැලකෙන්නේ,
(1) මහාවංශය සහ උම්මග්ග ජාතකය යි.
(2) චූලවංශය සහ දඹදෙණි අස්න යි.
(3) චූලවංශය සහ කඳවුරු සිරිත යි.
(4) මහාවංශය සහ චූලවංශය යි.
(5) කඳවුරු සිරිත සහ මහාවංශය යි. (.........)

Department of Examinations

**14.** උඩරට, පහතරට හා සබරගමු සම්ප්‍රදායයන්ට අයත් ශාන්තිකර්ම නාට්‍යමය පෙළපාළි පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) විජේරාජ කතාව, අඹ විදමන සහ පොත්කඩේ යක්කම
(2) ඌරා යක්කම, දෙවොල් ගොඩබෑසීම සහ මුවමල විදීම
(3) ඌරා යක්කම, නානුමුරය සහ පොත්කඩේ යක්කම
(4) නයා යක්කම, අඹ විදමන සහ වැදි යක්කම
(5) මහා යක්කම, බොරු යක්කම සහ ගබඩා කොල්ලය (.........)

**15.** රංග වින්‍යාසය හා සබැඳි මූලික සංකල්ප ලෙස සැලකෙන්නේ,
(1) චලනය, ශරීරය සහ අංගහාර වේ.
(2) චලනය, අවකාශය සහ සම්බන්ධතා වේ.
(3) ශරීරය, හැඩතල සහ නිර්මාණ වේ.
(4) ශරීරය, තාලය සහ හැඩතල වේ.
(5) අංග, ප්‍රත්‍යාංග සහ උපාංග වේ. (.........)

**16.** රජයේ ලලිත කලායතනය ආරම්භ කරන ලද වර්ෂය කුමක් ද?
(1) 1936
(2) 1945
(3) 1952
(4) 1972
(5) 1974 (.........)

**17.** පහත A සහ B තළගත රූප දැකගතහැකි වන්නේ,


A


B

(1) ගඩලාදෙණිය විහාරයේ හා ඇම්බැක්කේ දේවාලයේ ය.
(2) බෙන්තොට ගලපාත විහාරයේ හා ඇම්බැක්කේ දේවාලයේ ය.
(3) ඇම්බැක්කේ දේවාලයේ හා යාපහුව මාළිගාවේ ය.
(4) බෙන්තොට ගලපාත විහාරයේ හා යාපහුව මාළිගාවේ ය.
(5) ගඩලාදෙණිය විහාරයේ හා යාපහුව මාළිගාවේ ය. (.........)

**18.** ශාන්තිකර්ම සැරසිලි ආශ්‍රිත කැටයම් නිර්මාණය කිරීම සඳහා භාවිත අමුද්‍රව්‍ය ලෙස සැලකෙන්නේ,
(1) රඹ පතුරු, ගොක්කොළ සහ නියඳ කෙඳි ය.
(2) ගොක්කොළ, බුරුල්ල අතු සහ රඹ පතුරු ය.
(3) ගොක්කොළ, පුවක් අතු සහ නියඳ කෙඳි ය.
(4) තොලඹෝ, හබරල සහ ගොක්කොළ ය.
(5) රඹ පතුරු, ගොක්කොළ සහ හබරල කොළ ය. (.........)

**19.** "ගත්තම් ගත් දිත ගදිතකු දොම් දොම් ත කු දොම් ......" මෙම පද කොටස අයත් නර්තනාංගය වන්නේ,
(1) ගිරිදේවි නර්තනය යි.
(2) ශුද්ධමාත්‍රය යි.
(3) මංගලම් නර්තනය යි.
(4) මුල්මාත්‍රය යි.
(5) දෙවොල් නර්තනය යි. (.........)

**20.** සළු පාළිය සහ මරු සන්නියේ දී උද්දීපනය වන රස වන්නේ,
(1) හාස්‍ය සහ වීර රසය යි.
(2) බීභත්ස්‍ය සහ භයංකාර රසය යි.
(3) ශෘංගාර සහ රෞද්‍ර රසය යි.
(4) හාස්‍ය සහ භයානක රසය යි.
(5) ශාන්ත සහ වීර රසය යි. (.........)

**21.** ශාන්තිකර්මවල දී වෙස් මුහුණු වෙනුවට අංග රචනා ක්‍රමවේද භාවිත කෙරෙන චරිත ලෙස සැලකෙන්නේ,
(1) රීරියකා සහ ලිච්ඡවී ය.
(2) රීරියකා සහ වඩිගපටුන ය.
(3) වඩිගපටුන සහ කෝල සන්නිය යි.
(4) ලිච්ඡවී සහ ගොළු සන්නිය යි.
(5) වඩිගපටුන සහ මරු සන්නිය යි. (.........)

Department of Examinations

22. වලියක් මංගල්‍යය ශාන්තිකර්මය පවත්වනු ලබන්නේ,
(1) මහනුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ දී ය. (2) මහනුවර පත්තිනි දේවාලයේ දී ය.
(3) මහනුවර දළදා මාළිගාවේ දී ය. (4) අළුත්නුවර ශ්‍රී විෂ්ණු දේවාලයේ දී ය.
(5) අළුත්නුවර පත්තිනි දේවාලයේ දී ය. (.........)

23. "කළුවන් කළුරුවයි මංගෝ දිලිසෙනවා" මෙය,
(1) පැල් කවියකි. (2) නෙළුම් කවියකි.
(3) පතල් කවියකි. (4) කරත්ත කවියකි.
(5) හටන් කවියකි. (.........)

24. 'චක්කියාර් කුත්තු' රඟ දක්වන ලද නර්තන සම්ප්‍රදාය කුමක් ද?
(1) භරත නාට්‍යයම් ය. (2) කථකලි ය.
(3) කථක් ය. (4) ඔඩිසි ය.
(5) මෝහිණි ආට්ටම් ය. (.........)

25. පහත රූපයෙන් දැක්වෙන අවස්ථාව අයත් මුද්‍රානාට්‍ය වන්නේ,



(1) නිදි කුමරිය ය. (2) කරදිය ය.
(3) බැරිසිල් ය. (4) පටාචාරා ය.
(5) කුඹී කතාව ය. (.........)

- අංක **26** සිට **35** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර යොදා **හිස්තැන් පුරවන්න.**

26. ඇදෙන අකුරක් සමග හල් අකුරක් එකතුවීමෙන් ................................ මාත්‍රයක් නිර්මාණය වේ.

27. ශබ්දම්, පදම් හා තිල්ලානා යන නර්තන අංග ................................ නර්තන සම්ප්‍රදායයට අයත් වේ.

28.
```
x              2               0            3
ධා  ධිං  s | ධා ධා  ධිං s | තා  තිං  s | ධා ධා  ධිං s |
```
යන හින්දුස්ථානි දීප්චන්දි තාලය, දේශීය තිත් තාල ක්‍රමයට අනුව ................................ දෙතිතට සමාන වේ.

29. "ග ත ගුම් රිම්ගත ගදිගත ගදිත ගතම්" යන බෙරපදයට අනුව ................................ කෝලම සභාවට පිවිසෙයි.

30. ඉතාලියේ ප්‍රභවය වූ බැලේ රංග කලාව, XIV වන ලුවී රජුගේ අනුග්‍රහයෙන් ................................ දී වඩාත් සංවර්ධිත තත්ත්වයකට පත් විය.

31. කීල බැඳීම, කාලි යාම හා ගරා නැටීම යන චාරිත්‍ර ඉටු කරනු ලබන්නේ උඩරට ................................ ශාන්තිකර්මයේ දී ය.

32. පතහවිස්ස, මාලක්කම, බඹර වළල්ල යනු ................................ නර්තන සම්ප්‍රදායේ භාවිත පැනීම්, කැරකීම් විධි කිහිපයකි.

33. තම්මැට්ටමේ ගැටිවැල සහ ................................ සඳහා කිරිඳි වැල් භාවිත කිරීම වඩාත් යෝග්‍ය වේ.

34. බැරිසිල් මුද්‍රානාට්‍යයෙහි රංග වින්‍යාසය සැලසුම් කර ඇත්තේ ................................ විසිනි.

35. එදිරිවීර සරත්චන්ද්‍රයන්ගේ නිර්මාණයක් වූ සිංහබාහු ................................ නාට්‍යයකි.

Department of Examinations

● අංක **36** සිට **50** තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

**36.** "අක්කා ඉතින් නාඩන්නේ" මෙහි අන්තර්ගත ලඝු සහ ගුරු මාත්‍රා ගණන දක්වන්න.

(i) ලඝු මාත්‍රා : ....................................................................

(ii) ගුරු මාත්‍රා : ....................................................................

**37.** රුක්මණී දේවි අරුන්ඩෙල් හා අච්චන් මහරාජ් යන අය පුරෝගාමී වූ නර්තන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) රුක්මණී දේවි අරුන්ඩෙල් : ....................................................

(ii) අච්චන් මහරාජ් : ....................................................................

**38.** බුදුසිරු කුමරු පිළිබඳ කතා පුවත සම්බන්ධ ශාන්තිකර්මය හා එය අයත් නර්තන සම්ප්‍රදායය නම් කරන්න.

(i) ශාන්තිකර්මය : ....................................................................

(ii) සම්ප්‍රදායය : ....................................................................

**39.** බටහිර බැලේ රංගන ශිල්පිනියන් භාවිත කරන රැලි සහිත කෙටි ගවුම හා දිග ගවුම හඳුන්වන නාමයන් සඳහන් කරන්න.

(i) කෙටි ගවුම : ....................................................................

(ii) දිග ගවුම : ....................................................................

**40.** පොලොන්නරු යුගයේ සරස්වතී මණ්ඩපය සහ සැටදාගෙය ඉදිකරන ලද රජවරුන් නම් කරන්න.

(i) සරස්වතී මණ්ඩපය : ....................................................................

(ii) සැටදාගෙය : ....................................................................

**41.** පහත **A** හා **B** රූපවල දැක්වෙන වෙස් මුහුණු භාවිත වන්නේ කිනම් චරිත නිරූපණය කිරීම සඳහා ද?



A



B

(i) **A** රූපය : ....................................................................

(ii) **B** රූපය : ....................................................................

**42.** බලි ශාන්තිකර්මයේ දී බලි ඇදුරා භාවිත කරන ප්‍රධාන රංගභාණ්ඩ **දෙක** නම් කරන්න.

(i) ....................................................................

(ii) ....................................................................

**43.** අතිශයෝක්ති වර්ණනා සහිතව මහනුවර යුගයේ දී නිර්මාණය වූ ගායන විශේෂය හා එය ප්‍රාසංගිකව ඉදිරිපත් කළ ස්ථානය නම් කරන්න.

(i) ගායන විශේෂය : ....................................................................

(ii) ස්ථානය : ....................................................................

Department of Examinations

**44.** පහත දැක්වෙන නර්තන අංග අයත් ශාන්තිකර්ම වෙන් කොට දක්වන්න.

(i) ආඬිගුරු නැටීම : ..........................................................

(ii) ලිච්ඡවි නර්තනය : ..........................................................

**45.** "රනේ රන් වළලු අතලා ගෙනේ යා – කනේ එරන් පුස්කොළ ලා ගෙනේයා"
යන කවිය අයත් ශාන්තිකර්මය හා පෙළපාළි අංගය නම් කරන්න.

(i) ශාන්තිකර්මය : ..........................................................

(ii) පෙළපාළි අංගය : ..........................................................

**46.** **ථුම්රි** සහ **තෝඩායම්** නර්තන අංග අයත් සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) ථුම්රි : ..........................................................


(ii) තෝඩායම් : ..........................................................

**47.** ප්‍රස්තාරකරණයේ දී තිත් හා තෙයි (∧, /) යන තාල සංකේත සඳහා භාවිත වන පාරිභාෂික වචන ලියන්න.

(i) ∧ : ..........................................................

(ii) / : ..........................................................

- අංක **48** සිට **49** තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප ඇසුරින් පිළිතුරු සපයන්න.



A B C D

**48.** ඉහත **A** සහ **B** රූපවලින් දක්වා ඇති නළලට පලඳින රංගාභරණ නම් කරන්න.

(i) **A** : ..........................................................

(ii) **B** : ..........................................................

**49.** ඉහත **C** සහ **D** රූපවලින් දක්වා ඇති නළලට පලඳින රංගාභරණ භාවිත වන සම්ප්‍රදායයන් නම් කරන්න.

(i) **C** : ..........................................................

(ii) **D** : ..........................................................

**50.** අංග රචනයේ දී මිනිස් මුහුණක මූලික ආකෘති වෙන්කර ගනු ලැබේ. ඒ අතුරින් පහත දැක්වෙන හැඩතල හඳුන්වන පාරිභාෂික නාමයන් ලියා දක්වන්න.

(i) ◯ : ..........................................................

(ii) △ : ..........................................................

* * *

Department of Examinations

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020

නව නිර්දේශය/ புதிய பாடத்திட்டம

විෂය අංකය / பாட இலக்கம்: **52**

විෂයය / பாடம்: **නර්තනය (දේශීය)**

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்

## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 1 | 21. | 5 |
| 02. | 3 | 12. | 2 | 22. | 1 |
| 03. | 5 | 13. | 4 | 23. | 3 |
| 04. | 3 | 14. | 3 | 24. | 2 |
| 05. | 2 | 15. | 2 | 25. | 4 |
| 06. | 1 | 16. | 3 | | |
| 07. | 4 | 17. | 2 | | |
| 08. | 4 | 18. | 5 | | |
| 09. | 5 | 19. | 2 | | |
| 10. | 3 | 20. | 4 | | |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 25 = 50



Department of Examinations

## I පත්‍රය

26. ප්ලුත
27. භරත
28. මැදුම් මහ (3 + 4)
29. මුදලි
30. ප්‍රංශයේ
31. වලියක් මංගල්‍යය
32. පහතරට
33. කඩිප්පුව
34. ආරියරත්න කළුආරච්චි මහතා
35. ශෛලිගත

| | | |
|---|---|---|
| 36. | i. ලඝු 1 යි | ii. ගුරු 6 යි |
| 37. | i. භරත | ii. කථක් |
| 38. | i. කිරිමඩුව | ii. සබරගමු |
| 39. | i. ක්ලැසික් යුගය | ii. රොමැන්ටික් යුගය |
| 40. | i. මහා පරාක්‍රමබාහු රජු | ii. නිශ්ශංකමල්ල රජු |
| 41. | i. A- මුදලි කෝලම | ii. B- අණබෙර කෝලම |
| 42. | i. අත්මිණිය (ගගනය,වජ්‍රාමිණිය) | ii. පන්දම |
| 43. | i. ප්‍රශස්ති | ii. කවිකාර මඩුව |
| 44. | i. කිරිමඩුව | ii. දහඅට සන්නිය / සන්නියකුම |
| 45. | i. රටයකුම (රිද්දියාගය) | ii. නානුමුරය (දොළහ පෙළපාලිය) |
| 46. | i. කථක් | ii. කථකලි |
| 47. | i. ක්ෂණාන්ත | ii. හීනාන්ත |
| 48. | i. A - නෙත්තිමාලය | ii. B- නෙත්ති පට්ටම් |
| 49. | i. C- පහතරට | ii. D- සබරගමු |
| 50. | i. ගෝලාකාර | ii. ත්‍රිකෝණාකාර |

*ප්‍රශ්න අංක 01 - 25 දක්වා* (02 x 25) *ලකුණු 50*

*ප්‍රශ්න අංක 26 - 50 දක්වා* (02 x 25) *ලකුණු 50*

*මුළු ලකුණු 100*

Department of Examinations

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

නව නිර්දේශය / புதிய பாடத்திட்டம் / New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**
- ※ මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
- ※ **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
- ※ **II** හා **III** කොටස්වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
- ※ සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

(අ) තකු ජිං ජිං තක ජිංතක ජිං කුද

(ආ) දොම් තත් දිතගත ගදිතකු දොම් ගත

(ඉ) ජිං ජිං තක් කරතක තත් කිට ජිම් තක

(ii) පහත සඳහන් කවි පද සුළු මහ දෙතිතට අනුව ප්‍රස්තාර කරන්න.

"කොසඹෝ දිය නාපු-වයි වයි ගොඩ පැනපු"

(iii) ගජගා වන්නමේ අඩව්ව හෝ කොණ්ඩනාච්චි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ අටකුරු ගාහක වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

**2.** දේශීය නර්තන ඉතිහාසය පිළිබඳ තොරතුරු අධ්‍යයනයේ දී ලිඛිත හා පුරාවිද්‍යා මූලාශ්‍රය වැදගත් වේ.

(i) අනුරාධපුර යුගයේ නර්තන කලාව පැවති තත්ත්වය පිළිබඳ පුරාවිද්‍යා මූලාශ්‍රය **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.

(ii) පොලොන්නරු යුගයේ නර්තන කලාව කෙරෙහි භාරතීය ආභාසය ලැබී ඇති බව සාධක **දෙකක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(iii) දේශීය නර්තන කලාව ප්‍රවර්ධනය වූ අවධියක් ලෙස 1930 හා 1940 දශක දෙක දැක්විය හැකි ය. සාධක **හතරක්** ඇසුරින් විමසන්න.

## II කොටස

**3.** දේශීය ශාන්තිකර්ම විවිධ ඇදහිලි විශ්වාස මෙන්ම චාරිත්‍රවිධිවලින් සමන්විත වේ.

(i) කිරිමඩුව ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

(ii) සමාජ යහපැවැත්ම උදෙසා සන්නියකුම ශාන්තිකර්මයේ කථා පුවත් මගින් පිළිබිඹු වන සමාජ සාරධර්ම පිළිබඳ සාකච්ඡා කරන්න.

(iii) වලියක් මංගල්‍යය ශාන්තිකර්මයේ ආගමික පසුබිම හා සමාජීය විශ්වාස පිළිබඳ විග්‍රහයක් කරන්න.

**4.** දේශීය ශාන්තිකර්මයන්හි ගායන විධි, රංග භාණ්ඩ, වස්ත්‍රාභරණ සහ සැරසිලි ක්‍රමවල විශේෂතා දක්නට ලැබේ.

(i) බලි ශාන්තිකර්ම ගායනා වර්ග **දෙකක්** පිළිබඳ හැඳින්වීමක් කරන්න.

(ii) රටයකුම ශාන්තිකර්මයට අයත් නානුමුරය පෙළපාලි අංගයේ දක්නට ලැබෙන විශේෂතා, රංග භාණ්ඩ හා වස්ත්‍රාභරණ ඇසුරින් විමසන්න.

(iii) සන්නියකුම ශාන්තිකර්මයේ රංග වස්ත්‍රාභරණ සහ සැරසිලි ක්‍රම පිළිබඳ ඇගයීමක් කරන්න.

**5.** ගැමි නැටුම් හා ගැමි නාටක මගින් තත්කාලීන ජන සමාජයේ ජීවන රටාව විවරණය කරයි.

(i) කුණුරුවන් සහ දෙවියන් පෙරදැරි කරගෙන ගැමි ගායනා නිර්මාණය වී ඇති බව ගැමි නැටුම් **දෙකකට** අයත් ගායනා ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ii) සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතිකාංගවල සමානතා ඇති බව ජන නැටුම් **දෙකක්** ඇසුරින් විමසන්න.

(iii) කෝලම් නාටකය මගින් සමාජ දුශ්චරිත උපහාසයට ලක් කරයි. ජස හා මුදලි කෝලම් චරිත ඇසුරින් විචාරය කරන්න.

## III කොටස

**6.** පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| මෘදංගය | කල්පනා | මාරියස් පෙටිපා |
| කෝල් බෙරය | බැරිසිල් | චෛයිකොව්ස්කි |
| තබ්ලාව | ශාකුන්තලය | නිජින්ස්කි වස්ලව් |
| චෙන්ඩාව | පටාචාරා | II වන හෙන්රි රජු |

(i) (අ) කොටස - කථක් නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩය තෝරාගෙන ඒ පිළිබඳ විස්තර කරන්න.

(ii) (ආ) කොටස - ඔබ කැමති දේශීය මුද්‍රා නාට්‍යයක් තෝරාගෙන එහි චරිත නිරූපණය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ විස්තරයක් කරන්න.

(iii) (ඉ) කොටස - නට් ක්‍රැකර් බැලේ නාට්‍යයේ රංග රචනය කළ ශිල්පියාගේ නිර්මාණ පිළිබඳව ඇගයීමක් කරන්න.

**7.** සාම්ප්‍රදායික රඟමඩලේ සහ නූතන වේදිකාවේ විවිධ වෙනස්කම් දැකිය හැකි ය.

(i) 'රංග භූමිය' නිර්වචනය කරන්න.

(ii) නූතන වේදිකාවක දැකිය හැකි නව ප්‍රවණතා **තුනක්** විස්තර කරන්න.

(iii) ශාන්තිකර්ම ආශ්‍රිත ආලෝකකරණය සහ නූතන වේදිකා ආලෝකකරණය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

**8.** රූපවාහිනිය මගින් විකාශය වන නර්තන වැඩසටහන්වලින් නිර්මාණකරණයට හා විචාරයට අවස්ථාව සැලසේ.

(i) රූපවාහිනිය මගින් විකාශය වන නර්තන වැඩසටහන් **තුනක්** පිළිබඳව විස්තර කරන්න.

(ii) රියැලිටි නර්තන නිර්මාණ සඳහා විදේශීය ආභාසය ලැබී ඇති ආකාරය රංගවින්‍යාසය හා රංග වස්ත්‍රාභරණ ඇසුරින් පැහැදිලි කරන්න.

(iii) "සාම්ප්‍රදායික නර්තනය සංරක්ෂණය සඳහා රූපවාහිනී මාධ්‍යය ඉවහල් වී ඇත." විචාරයට ලක් කරන්න.

* * *

Department of Examinations

## I කොටස

01. (i) පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන ප්‍රස්තාර කරන්න.

(අ) තකු ජිං ජිං තක ජිංතක ජිං කුඳ

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ත | කු | ජිං | - | ජිං | - | ත | ක | ජිං | - | ත | ක | ජිං | - | කු | ඳ |

(ආ) දොම් තත් දිතගත ගදිතකු දොම් ගත

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොම් | - | තත් | - | දි | ත | ග | ත | ග | දි | ත | කු | දොම් | - | ග | ත |

(ඉ) ජිං ජිං තත් කරතක තත්කිට ජිමිතක

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජිං | - | ජිං | - | තත් | - | කර | තක | තත් | - | කි | ට | ජි | මි | ත | ක |

*නිවැරදි විභාග වලට වෙන්කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*
*බෙරපද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

Department of Examinations

(ii) පහත සඳහන් කවි පද සුළු මහ දෙතිතට අනුව ප්‍රස්තාර කරන්න.

"කොසඹෝ දිය නාපු - වයි වයි ගොඩ පැනපු"

| ∧ | | / | | | | ∧ | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 1 | 2 | 3 | 4 |
| + | + | කො | ස | බෝ | - | - | - | දි | - | ය | - |
| + | + | නා | - | පු | - | - | - | - | - | - | - |
| - | - | - | - | - | - | - | - | - | - | - | - |
| + | + | ව | යි | ව | - | යි | - | ගො | - | ඩ | - |
| + | + | පැ | න | පු | - | - | - | - | - | - | - |
| - | - | - | - | - | - | - | - | - | - | - | - |

යතිය නොතිබුණ ද ලකුණු ප්‍රදානය කළ හැකිය.

*නිවැරදි විභාග වලට වෙන්කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*
*බෙරපද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04*
*මුළු ලකුණු 06*

(iii) ගජගා වන්නමේ අඩව්ව හෝ කොණ්ඩනාච්චි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ අටකුරු ගාහක වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

- ගජගා වන්නමේ අඩව්ව

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| ක්‍රී | - | ස් | ත | කි | ටි | ත | ක | තත් | - | ති | කි | ටික් | - | කි | ට |
| කි | ටි | තත් | - | කි | ටි | ත | කු | දා | - | - | - | - | - | - | - |
| ත | ජි | ජි | ක | රොං | - | දං | - | ජි | ජි | ජි | ක | රොං | - | දං | - |
| තක් | කඩ | ජික් | කඩ | තොං | කඩ | තරි | කිට | ජිත් | - | - | ජි | ජෙ | හි | ජිත් | - |
| තත් | ජිත් | තක | ජිත් | තත් | ජිත් | තොං | නං | තා | | | | | | | |



Department of Examinations

- කොණ්ඩනාච්චි තාලය සින්දු වන්නමේ ඉරට්ටිය

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දොම් | - | තම් | - | දි | ත | ග | ත | දොම් | - | දොම් | - | තත් | - | තත් | - |
| ගුහි | තිග | දිරි | කිට | ගත් | - | තත් | - | ගුහි | තිග | දිරි | කිට | ගු | ද | ගු | ද |
| ගත් | - | ත | දිත් | - | ත | ග | ත | ගත් | - | දි | ත | ග | ත | දිත් | - |
| තා | | | | | | | | | | | | | | | |

- අටකුරු ගාහක වන්නමේ අඩව්ව

| / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| දිරි | කිට | තරි | කිට | ග | ති | ග | ත | කු | කු | ද | ග | ති | ත | ග | ත |
| දිරි | කිට | තත් | - | දිරි | කිට | තරි | කිට | දොං | - | ත | ග | ති | ත | ග | ත |
| ග | ති | ග | ත | දිරි | කිට | තරි | කිට | තා | - | ජී | - | මිත් | - | තත් | - |
| ග | ති | ග | ත | දිරි | කිට | තරි | කිට | තා | | | | | | | |

Department of Examinations

*නිවැරදි විභාග වලට වෙන්කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02*
*බෙරපද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 06*
*මුළු ලකුණු 08*

(i) 6+ (ii) 6+ (iii) 8 = *මුළු ලකුණු 20*

02. දේශීය නර්තන ඉතිහාසය පිළිබඳ තොරතුරු අධ්‍යනයේදී ලිඛිත හා පුරාවිද්‍යා මූලාශ්‍රය වැදගත් වේ.

(i) අනුරාධපුර යුගයේ නර්තන කලාව පැවැති තත්වය පිළිබඳ පුරාවිද්‍යා මූලාශ්‍රය දෙකක් ඇසුරෙන් විස්තර කරන්න.

- සැස්සේරුව සහ සිතුල්පව්ව කොරවක්ගල සෙල්ලිපිවල නර්තනය පිළිබඳ තොරතුරු හෙළි වන බව
- කුට්ටම් පොකුණෙන් සොයා ගන්නා ලද නළගනකගේ ලෝකඩ රූපය මගින් නර්තන විලාශය පිළිබිඹු වන බව
- ලෝවාමහාපායේ කණුහිස්වල රූකම් හි නර්තනය හා සම්බන්ධ වාද්‍ය භාණ්ඩ සංකේතවත් වන බව

මූලාශ්‍රය දෙකක් නම් කිරීමට ලකුණු 02
විස්තර කිරීමට ලකුණු 04
මුළු ලකුණු 06

(ii) පොලොන්නරු යුගයේ නර්තන කලාව කෙරෙහි භාරතීය ආභාසය ලැබී ඇති බව සාධක දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

- අංක 2 දරණ ශිව දේවාලයෙන් ලෝකඩ නටරාජා ප්‍රතිමාවක් සොයා ගත් බව
- පාලමොට්ටායි ශිලා ලිපියෙහි දේවදාසි නර්තනය පිළිබඳ තොරතුරු සඳහන් වන බව
- දිදිගම සුතිඝර චෛත්‍ය හෙවත් කොටවෙහෙරෙන් සොයා ගන්නා ලද ඇත් පහනේ එල්ලෙන දම්වැලෙහි භාරතීය නර්තන විලාශය දක්වෙන රූකම් ඇති බව
- සැටදාගෙයි ඇතුළුවන ස්ථානයේ බිත්ති දෙපස භාරතීය නර්තන ආභාස සහිත රූකම් ඇති බව

*සාධක දෙකට - ලකුණු 02*

*භාරතීය ආභාෂය ලැබූ බව විස්තර කිරීමට ලකුණු 04*

*මුළු ලකුණු 06*

(iii) දේශීය නර්තන කලාව ප්‍රවර්ධනය වූ අවධියක් ලෙස 1930 හා 1940 දශක දෙක දැක්විය හැකිය. සාධක හතරක් ඇසුරින් විමසන්න.

- 1930 දශකයේදී චන්ද්‍රලේඛා , මේරියම් පීරිස් යන ප්‍රභූ කාන්තාවන් නර්තන කලාවට පිවිසි බව
- 1934 රබින්ද්‍රනාත් තාගොර්තුමාගේ පැමිණීම නිසා කලා ප්‍රබෝධය ඇති වූ බව
- 1936 විල්මට් ඒ පෙරේරා මැතිඳුන්ගේ කැපවීමෙන් හොරණ ශ්‍රීපාලිය බිහි වූ බව
- 1936 දී අධ්‍යාපන අධ්‍යක්ෂකවරයකු වූ එස්.එල්.බී. කපුකොටුව මහතාගේ ප්‍රධානත්වයෙන් ලංකා ගාන්ධර්ව සභාව ආරම්භ කොට එමගින් විභාග පැවැත්වීම
- 1943 දී පාසල්වල නර්තන විෂය ඉගැන්වීම ආරම්භ වූ බව

*සාධක 04 ක් විස්තර කර ඇත්නම් කිරීමට ලකුණු 08*

(i) 6+ (ii) 6+ (iii) 8 =*මුළු ලකු ණු 20*

Department of Examinations

II කොටස

3. දේශීය ශාන්තිකර්ම විවිධ ඇදහිලි විශ්වාස මෙන්ම චාරිත්‍ර විධිවලින් සමන්විත වේ.

I. කිරිමඩුව ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

- ගව පට්ටිවලට ඇති වන්නා වූ රෝග පීඩා දුරු කර, ආරක්ෂා කර ගැනීම සඳහා කළ බව
- ගව මහීෂාදී සම්පත් සංවර්ධනය සඳහා කළ බව.
- කෘෂිකර්මාන්තය හා ජන ජීවිතයට අත්‍යාවශ්‍ය කාර්යයන් රැසක් ගවයාගෙන් ඉටු වන බව

කරුණු දෙකක් දක්වා තිබීම ලකුණු -02

අරමුණු පැහැදිලි කර විස්තර කිරීමට ලකුණු -04

මුළු ලකුණු -06

II. සමාජ යහපැවැත්ම උදෙසා සන්නියකුම ශාන්තිකර්මයේ කතා පුවත් මගින් පිළිබිඹු වන සමාජ සාරධර්ම පිළිබඳ සාකච්ඡා කරන්න.

- සන්නියකුමේ සංඛපාල හා දං උදියාගේ කථාව ඇසුරින් උදාහරණ ගෙන සනාථ කළ හැකි බව
- සංඛපාල කථාවේ අයහපත් ක්‍රියාවන් ලෙස බොරුකීම, කේලාම් කීම, කේලාම් ඇසීම, ඊර්ෂ්‍යාව, වෛරය, පළිගැනීම වැනි සිතුවිලිවලින් සමාජ සාරධර්ම පිරිහෙන බව
- දං උදියාගේ කථාව ඇසුරෙන් සමාජය මුලා කිරීම, රැවටීම වැනි පාප ක්‍රියාවන්හි නිරත වීමෙන් අයහපත් ඵල විපාක ලැබෙන බව.
- පවුල් සංස්ථා බිඳ වැටීම, මාතෘත්වයේ මානසික අසහනය සන්නි චරිත බිහිවීමෙන් සාරධර්ම ගිලිහෙන බව.

කතා පුවත් දෙක ඇසුරින් සාකච්ඡා කිරීම ලකුණු 06

III. වලියක් මංගල්‍යය ශාන්තිකර්මයේ ආගමික පසුබිම හා සමාජීය විශ්වාස පිළිබඳ විග්‍රහයක් කරන්න.

- මහනුවර දළදා පෙරහැර අවසානයේ විෂ්ණු දේවාලයේ දී පැවැත්වෙන බව
- බෞද්ධ ඇදහීම් හා දේව ඇදහීම් පිළිබිඹු වන බව
- පෙරහැරට සහභාගී වන සියලුදෙනාගේ වස් දොස් දුරු කර සෙත් ශාන්තිය සඳහා සිදුකරන බව
- ගවරමලේ ඇට එහි සෞභාග්‍ය පිළිබඳ විශ්වාසයක් ඇති බව
- සියලුම ශිල්පීන් පරහඳ ගැමෙන් අනතුරුව වලියකුම නැටීම ආරම්භ කරන බව
- නව කොළ අත්ත ස්පර්ශයෙන් සකල ශරීරයේ දෝෂ දුරු වන බව
- ඒකාවැලේ පඬුරු ගැට ගැසීම මගින් භාරහාර සිදුකරන බව
- පළමු දිනයේ සිට සත්වන දිනය දක්වා නියමිත වේලාවන් අනුව තේවා හේවිසි වාදනය හා පූජා චාරිත්‍ර ආරම්භ කිරීම.
- පිරිත් නූල හා පිරිත් හුයේ කවි ගායනය කරනු ලබන බව.
- සිවිලිය, මුව මල, සොළොස් මඟුල පූජා වස්තූන් භාවිත වන බව

ආගමික පසුබිම ලකුණු 04

සමාජීය විශ්වාස ලකුණු 04

ලකුණු 08

(i) 6+ (ii) 6+ (iii) 8 =මුළු ලකුණු 20

4. දේශීය ශාන්ති කර්මයන්හි ගායනා විධි, රංග භාණ්ඩ, වස්ත්‍රාභරණ සහ සැරසිලි ක්‍රමවල විශේෂතා දක්නට ලැබේ.

I. බලි ශාන්ති කර්ම ගායනා වර්ග දෙකක් පිළිබඳ හැඳින්වීමක් කරන්න.

- අෂ්ඨක, ග්‍රහපන්ති , සිරසපාද, කඩතුරා, බලි මඩුපුරය, ඇඹුම්, හිංහතර යන කවි ගායනා වර්ග හඳුනා ගෙන ඇති බව
- ඉහත කවි වර්ග දෙක විස්තර කිරීම (උදාහරණ ලෙස කවිය බැගින්)

ගායනා වර්ග දෙක නම් කිරීමට ලකුණු 02

කවි උදාහරණයට ගෙන විස්තර කිරීමට ලකුණු 04

මුළු ලකුණු 06

Department of Examinations

II. රටයකුම ශාන්තිකර්මයට අයත් නානුමුරය පෙළපාළි අංගයේ දක්නට ලැබෙන විශේෂතා, රංගභාණ්ඩ හා වස්ත්‍රාභරණ ඇසුරින් විමසන්න.

**රංග භාණ්ඩ හා රංග වස්ත්‍රාභරණවල විශේෂතා**

- උනුනුපියන හෙවත් නානුමුර වට්ටිය සුවිශේෂ රංගභාණ්ඩයක් ලෙස භාවිත කිරීම
- පරිසරයෙන් සපයා ගන්නා අමුද්‍රව්‍යවලින් රංගභාණ්ඩ සැකසෙන බව
- තෙල් කුප්පිය, හවරිය, පනාව, කැඩපත...... රංගභාණ්ඩ විස්තර කර ඇත්නම්
- කාන්තා ලාලිත්‍ය දැක්වෙන පරිදි සුදු සේලය හැට්ටය හා ගොප්කොළවලින් සකසන ලද වරලස යොදා ගන්නා බව
- නර්තනයේ දී කාන්තා චරිත නිරූපණය සඳහා ඇඳුරන් වෙස් ගන්නා බව
- නෘත්‍ය ලක්ෂණවලින් සමන්විතව, රිද්දි බිසව් දිය නා සළුපිළි පලඳින ආකාරය නිරූපණය කෙරෙන බව

රංග භාණ්ඩ වල විශේෂතා ලකුණු 03
රංග වස්ත්‍රාභරණ වල විශේෂතා ලකුණු 03
මුළු ලකුණු 06

III. සන්නි යකුම ශාන්තිකර්මයේ රංග වස්ත්‍රාභරණ සහ සැරසිලි ක්‍රම පිළිබඳ ඇගයීමක් කරන්න.

**රංගවස්ත්‍රාභරණ**

- පාළි, සන්නි හා යක්ෂ චරිත නිරූපනය කිරීම සඳහා වෙස් මුහුණු, කටකැලි භාවිත කරන බව
- සන්නි, පාළි,ලිච්ඡවී (කුමාර පෙළපාලිය), සහ සූනියම් යක්ෂණිය ආදි හැන්දෑ සමයමට අයත් නර්තන සඳහා රස භාවයන් උද්දීපනය වන අයුරින් රංගවස්ත්‍රාභරණ සැකසී ඇති බව
- හණ ලණු, නියඳ හෝ ඉඳි කොළ, නාවපට්ටා, කොළ අතු වෙස් ගැන්වීමට භාවිත කෙරෙන බව.

**සැරසිලි**

- සන්නි යකුන් වීදිය, මල් යහන්, පිදේනි තටු, සන්නි කුඩුව, කත්තිරික්ක....... වැනි සැරසිලි භාවිත කරන බව
- පරිසරයෙන් සපයා ගන්නා අමු ද්‍රව්‍ය භාවිත කරන බව

රංගවස්ත්‍රාභරණ පිළිබඳ විස්තර කිරීම ලකුණු 03
සැරසිලි පිළිබඳ විස්තර කිරීම ලකුණු 03
ඉහත කරුණු ඇසුරින් ඇගයීම කිරීමට ලකුණු 02
මුළු ලකුණු 08

(i) 6+ (ii) 6+ (iii) 8 = මුළු ලකුණු 20

Department of Examinations

5. ගැමි නැටුම් හා ගැමි නාටක මඟින් තත් කාලීන ජන සමාජයේ ජීවන රටාව විවරණය කරයි.

I. තුණුරුවන් හා දෙවියන් පෙරදැරි කරගෙන ගැමි ගායනා නිර්මාණය වී ඇති බව ගැමි නැටුම් දෙකකට අයත් ගායනා ඇසුරින් උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

- ගැමි ඇදහිලි හා විශ්වාස මත ගැමි ගායනා නිර්මාණය වී ඇති බව.
- වරම් වරම් ඉරසඳ දෙවි අනින් වරම්....... (ගොයම්)
- මල් මාලා සොඳ වරම් ලබනවා .......(කුළු)
- බෝ අත්තට වැද සිරස නමන්නේ........(ලී කෙළි)
- උදේ සිටන් වකුටු කොන්ද දිග හැරපල්ලා........(ගොයම්)
- ලොව සෙත් කරවන පත්තිනි සඳිනේ....(පතුරු)
- පළමුව බුද්ධං සරණේ නමකර.........(පතුරු)
- සිරසට තබමි මුණි බුදුගුණ සිහි කරලා.... (පතුරු)

ගැමි නැටුම් හි භාවිත ගැමි ගායනා දෙකක් හඳුනාගෙන ඇත්නම් ලකුණු 02

උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් ලකුණු 04

මුළු ලකුණු 06

II. සිංහල හා දෙමළ ජනතාවගේ සංස්කෘතිකාංගවල සමානතා ඇති බව ජන නැටුම් දෙකක් ඇසුරින් විමසන්න.

- සිංහල ජන නැටුම් - ලී කෙළි, කළගෙඩි, කුළු, ගොයම්
- ද්‍රවිඩ ජන නැටුම් - කෝලාට්ටම්, චෙම්බු, සුලකු, අරවිවෙට්ටු

ජන නැටුම් දෙකක් තෝරා ගෙන සමානතා පිළිබඳ විමසීමක් කර ඇත්නම් ලකුණු 06

මුළු ලකුණු 06

III. කෝලම් නාටකය මඟින් සමාජ දුශ්චරිත උපහාසයට ලක් කරයි. ජස හා මුදලි කෝලම් ඇසුරින් විචාරය කරන්න.

- ජස හා මුදලි චරිත මගින් ඔවුන්ගේ ක්‍රියා කලාපයන් හාස්‍යයට හා උපහාසයට ලක් කර ඇති බව
- ජස-බීමත්කම, සුරාව, පවුල් සංස්ථාව තුල ඇති නොසන්සුන්කම, අඹුසැමි සබඳතා ඝට්ටනය, බහු විවාහය
- මුදලි රාජකාරිය පැහැර හැරීම, අල්ලස, කාන්තා ලොල් බව, මාන්නය පිළිබඳ සමාජ විවරණයක් ඇති බව
- චරිත ස්වභාවයන්ට අනුකූල නර්තනය, ගායනය හා වාදන අංගයන්ගේ සහසම්බන්ධතාවයක් ඇති බව.
- ප්‍රේක්ෂකයන්ට වින්දනය මෙන්ම උපහාසය මගින් ආදර්ශයක් ලබා දෙන බව

ජස හා මුදලි චරිත දෙක විස්තර කිරීම ලකුණු 04
විචාරය කිරීමට ලකුණු 04
මුළු ලකුණු 08

(i) 6+ (ii) 6+ (iii) 8 = මුළු ලකුණු 20



Department of Examinations

## III කොටස

06. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) (අ) කොටස - කථක් නර්තන සම්ප්‍රදායට අයත් වාද්‍ය භාණ්ඩය තෝරාගෙන ඒ පිළිබඳ විස්තර කරන්න.

<u>තබ්ලාව</u>

- කථක් නර්තනයේ ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩයක් බව.
- හින්දුස්ථානි සංගීතයෙහි ජනප්‍රිය වාද්‍ය භාණ්ඩය බව.
- අමීර් කුෂ්රු සංගීතඥයා තබ්ලාව නිපද වූ බව.
- තබ්ලාව කොටස් දෙකකින් සමන්විත වන බව.
- දකුණතින් වයන කොටස දහිනා හෙවත් දායන් නමින් ද, වමතින් වයන කොටස බායං හෙවත් ඩග්ගා නමින් හඳුන්වන බව.
- අතීතයේ තබ්ලාව මැටියෙන් තනා ඇති අතර පසුව තඹ හෝ පිත්තලයෙන් තනා ඇති බව.
- තබ්ලාව ඇසට කළු පැහැති බදාමයක් යොදා ඇති බව.

*තෝරා ගැනීමට ලකුණු* 02
*විස්තර කිරීමට ලකුණු* 04
*මුළු ලකුණු* 06

(ii) (ආ) කොටස - ඔබ කැමති දේශිය මුද්‍රා නාට්‍යයක් තෝරා ගෙන එහි චරිත නිරූපණය හා රංග වස්ත්‍රාභරණ පිළිබඳ විස්තරයක් කරන්න.

<u>පටාචාරා</u>

- චරිත නිරූපණය සඳහා දේශීය නර්තනය හා ජන නැටුම්, බටහිර හා භාරතීය නර්තනය ශෛලීන් උපයෝගි කරගෙන ඇති බව.
- රංග වස්ත්‍රාභරණ භාරතීය සංස්කෘතික ලක්‍ෂණයන්ගෙන් ආභාෂය ලබා ඇති බව.
- මුද්‍රා නාට්‍යයෙහි එක් එක් චරිත උද්දීපනය කිරීම සඳහා අවස්ථාවට උචිත පරිදි රංග වස්ත්‍රාභරණ නිර්මාණය වී ඇති බව.

*තෝරා ගැනීමට ලකුණු* 02
*විස්තර කිරීමට ලකුණු* 04
*මුළු ලකුණු* 06

Department of Examinations

(iii) (ඉ) කොටස - නට් ක්‍රැකර් බැලේ නාට්‍යයේ රංග රචනය කළ ශිල්පියාගේ නිර්මාණ පිළිබඳව ඇගයීමක් කරන්න.

මාරියස් පෙටිපා

- ප්‍රංශ ජාතිකයෙකු වන මොහු උපත ලද්දේ 1818 මාර්තු 11 දින බව (මාසෙලී - Marseeille නගරයේදීය. )
- ප්‍රවීණ නර්තන ශිල්පියෙකු, රංග රචකයෙකු හා ගුරුවරයෙකු බව.
- රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග්හි ඉම්පීරියල් බැලේ පාසල / ආයතනයට සම්බන්ධ වී සේවය කළ බව.
- හංසවිල/ නිදි කුමාරිය/ නට්ක්‍රැකර් යන බැලේ සඳහා රංග රචනය කළ බව.
- ඔපෙරා 35 ක නර්තන නිර්මාණය කළ බව.

Department of Examinations

*තෝරා ගැනීමට ලකුණු* 02
*ඇගයීමට ලක් කිරීමට ලකුණු* 06
*මුළු ලකුණු* 08

(i) 6+ (ii) 6+ (iii) 8 =*මුළු ලකුණු* 20

07. සම්ප්‍රදායික රඟමඩලේ සහ නූතන වේදිකාවේ විවිධ වෙනස්කම් දැකිය හැකිය.

(i) රංග භූමිය නිර්වචනය කරන්න.

- නර්තනයක් හෝ රංග කාර්යයක් ප්‍රේක්ෂකයන් ඉදිරියේ සිදු කරන ස්ථානයක් බව.
- භරතමුණිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි නාට්‍ය මණ්ඩපය, නාට්‍ය ගෘහය යනුවෙන් ද හඳුන්වන බව.

*නිර්වචනය කිරීමට ලකුණු* 06

(ii) නූතන වේදිකාවක දැකිය හැකි නව ප්‍රවණතා තුනක් විස්තර කරන්න.

- දුරස්ථ පාලක මගින් වේදිකා භූමිය රංගන කාර්යයේ විවිධ අවස්ථා සඳහා ඉහළට පහළට හැසිරවීමේ හැකියාව ඇති බව.
- කේබල් මාර්ගයෙන් නළු නිළියන් රංග අවකාශයෙහි තුළ ඉහළට පහළට ගෙන ඒමේ හැකියාව ඇති බව.
- ආලෝකකරණය (LED WALL) ආදි නවීන තාක්ෂණය භාවිත වන බව.
  උදා : නෙළුම් පොකුණ රඟහල
- විවිධ පැති හා තලවල සිට රංගන නැරඹිය හැකි බව.
- වේදිකාව හා ප්‍රේක්ෂකාගාරය අතර අවකාශය වෙන් කර තබන බව.

*ප්‍රවනතා තුනක් විස්තර කර ඇත්නම්*
*(3x 2) ලකුණු* 06

(iii) ශාන්තිකර්ම ආශ්‍රිත ආලෝකකරණය හා නූතන වේදිකා ආලෝකකරණය පිළිබඳ සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න.

ශාන්තිකර්ම ආශ්‍රිත ආලෝකකරණය

- ශාන්තිකර්ම රඟමඩල ආලෝක කිරීම සඳහා කොප්පරා, පන්දම් කැකුණ පන්දම්, තෙල් පන්දම්, පහන් හා විලක්කු භාවිතා කළ බව.
- යහන් ,වීදි හා තොරන්වල දල්වූ පහන් ආලෝකයෙන් ද ශාන්තිකර්ම රඟමඩල ආලෝකමත් වූ බව.
- අස්නේ, යක්ඇනුම, පන්දම් පද වැනි නර්තන අවස්ථාවලදී ද ශාන්තිකර්ම රඟමඩල ආලෝකමත් වන බව.
- 19 වන සියවසේ ප්‍රසංග වේදිකාවේ සංවර්ධනයත් සමඟ විදුලි ලාම්පු ආලෝකය වර්ගීකරණය වී නූතන වේදිකාවට එක් වූ බව.
- තිත් පහන් , ධාරා පහන්, පරිභ්‍රමණ ලාම්පු, යූ.වී. ලාම්පු, රසදිය වාෂ්පී ලාම්පු............ආදී වශයෙන් විස්තර කර තිබේනම්

*ශාන්තිකර්ම ආශ්‍රිත වේදිකා ආලෝකකරණයට ලකුණු 04*

*නූතන වේදිකා ආලෝකකරණයට ලකුණු 04*

*මුළු ලකුණු 08*

(i) 6+ (ii) 6+ (iii) 8 = *මුළු ලකුණු 20*

08. රූපවාහිනිය මගින් විකාශනය වන නර්තන වැඩසටහන්වලින් නිර්මාණකරණයට හා විචාරයට අවස්ථාව සැලසේ.

(i) රූපවාහිනිය මගින් විකාශනය වන නර්තන වැඩසටහන් තුනක් පිළිබඳ විස්තර කරන්න.

- විවිධ රූපවාහිනි නාලිකාවල විකාශනය වන නර්තන වැඩසටහන් නම් කිරීම.

  උදා : ලිට්ල් ස්ටාර් (දෙරණ)
  සුපර් ඩාන්සර් (හිරු)
  ඩාන්සින් ස්ටාර් (සිරස)
  සංචලන (ස්වාධීන රූපවාහිනිය)
  ගුරුගෙදර } ජාතික රූපවාහිනිය
  පරපුරෙන් පරපුරට }

- රූපවාහිනි නාලිකාවලින් අදාළ වැඩසටහන් විකාශය කෙරෙන ආකාරය පිළිබඳව කරුණු දක්වා තිබේනම්
- වැඩසටහන්වල ඉදිරිපත් කිරීමේ විවිධතා පිළිබඳ කරුණු දක්වා තිබේනම්

*ඉහත වැඩසටහන් තුනක් නම් කිරීමට ලකුණු 03*

*විස්තරකර තිබීමට ලකුණු 03*

*මුළු ලකුණු 06*

Department of Examinations

(ii) රියැලිටි නර්තන නිර්මාණ සඳහා විදේශීය ආභාසය ලැබී ඇති ආකාරය රංගවින්‍යාසය හා රංග වස්ත්‍රාභරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

<u>රංගවින්‍යාසය</u>

- නිර්මාණකරණයේදී තල, රටා, සම්බන්ධතා අවකාශය ආදිය භාවිතයෙ ප්‍රවණතා දක්නට ලැබෙන බව.
- විවිධ ශරීර චලන නිසිආකාරයට දිසාගතවන බව.
- විවිධ රටා, හැඩතල භාවිතයෙහි විශේෂතා ඇති බව.
- භාරතීය හා බටහිර රංග විධික්‍රම යොදා ගෙන ඇති බව.

<u>රංග වස්ත්‍රාභරණ</u>

- ප්‍රාසංගික වේදිකාවේ අද්‍යතන නිර්මාණකරණයට රංග වස්ත්‍රාභරණවලින් මනා පිටිවහලක් ලැබෙන බව.
- නර්තන නිර්මාණකරණයේදී බටහිර හා භාරතීය නර්තන රංගවස්ත්‍රාභරණ විවිධත්වය දැකිය හැකි බව.
- සමකාලීන බටහිර නර්තන රංග වස්ත්‍රාභරණ සඳහා සරල වූ නිර්මාණයන් යොදා ගන්නා බව.
- භාරතීය නර්තන රංග වස්ත්‍රවල වර්ණ,හැඩතල, රේඛා, උපයෝගී කොට ගන්නා බව.
- රංග වස්ත්‍රාභරණ නිර්මාණයේදී රෙදි, ලෝහ, රබර්, වීදුරු, පබළු භාවිත අමුද්‍රව්‍ය හා ජිමික්කි, කරමාල, මාට්ටල් සඳහා පැලදීමේ විශේෂතා

*රංගවින්‍යාසය ඇසුරෙන් පැහැදිලි කිරීමට ලකුණු 03*
*රංගවස්ත්‍රාභරණ ඇසුරෙන් පැහැදිලි කිරීමට ලකුණු 03*
*මුළු ලකුණු 06*

Department of Examinations

(iii) "සම්ප්‍රදායික නර්තනය සංරක්ෂණය සඳහා රූපවාහිනී මාධ්‍ය ඉවහල් වී ඇත. " විචාරයට ලක් කරන්න.

- රූපවාහිනී මාධ්‍ය මගින් නර්තනයේ සුවිශේෂ අවස්ථා සමීප හා දුරස්ථ රූප මගින් වඩාත් මතුකර දක්වන බව
- අභාවයට යමින් පවතින ශාස්ත්‍රීය නර්තනය නැවත භාවිතයෙන් ජනප්‍රියත්වයක් ඇති කෙරෙන බව.
- නර්තනයට අදාළ නාදමාලා, ශාස්ත්‍රීය පද, රංග භාණ්ඩ භාවිතය පිළිබඳ නූතන පරපුර දැනුවත් කිරීමෙන් ආරක්ෂා වන බව.
- ජාතික සංස්කෘතික උරුමයන් පිළිබඳ අවබෝධය හා පුද්ගල හැකියා තුළින් සංරක්ෂණය කළ හැකි බව.
- නවීන තාක්ෂණික උපකරණ භාවිතයෙන් සම්ප්‍රදායික නර්තනය සංරක්ෂණය කළ යුතු බව.

උදා : පරිඝනක, සංයුක්ත තැටි,සැනෙලි මතක (Pen Drive)

- නර්තන අවස්ථා රූගත කිරීම් සංස්කරණ කළ හැකි බැවින් වඩාත් ඵලදායී සාම්ප්‍රදායික නර්තන අවස්ථා වැඩසටහන් ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාව ඇති බව.
- රූගත කර ඇති රූපවාහිනී වැඩසටහන් දීර්ඝ කාලයක් ශ්‍රව්‍ය දෘශ්‍ය සංයුක්ත තැටි මගින් ගබඩා කර තබා ගත හැකි බව.

*කරුණු හතරක් ලියා තිබේනම් ලකුණු 08*

(i) 6+ (ii) 6+ (iii) 8 = *මුළු ලකුණු 20*

Department of Examinations